155088
2000 07 25
G. 3000/-

# බෞද්ධ ඉගැන්වීම් තුළින් ගම්‍ය වන පුනරුත්ථාපන සංකල්පය හා එහි ව්‍යවහාරිකත්වය පිළිබඳ අධ්‍යයනයක්

ශාස්ත්‍රපති උපාධිය

155038
98.09.30

1998 සැප්තැම්බර්

බෞද්ධ ඉගැන්වීම් තුළින් ගම්‍ය වන
පුනරුත්ථාපන සංකල්පය හා එහි ව්‍යවහාරිකත්වය
පිළිබඳ අධ්‍යයනයක්.

යූ.එල්.ජයන්ති ද සිල්වා

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති
( බෞද්ධ අධ්‍යයන ) උපාධි පරීක්ෂණයේ අවශ්‍යතාවක්
සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ
නිබන්ධයයි.

ලියා පදිංචි අංකය : ඒ 17008

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
ශ්‍රී ලංකාව
1998 සැප්තැම්බර්

## අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම පර්යේෂණ නිබන්ධය ශාස්ත්‍රපති (බෞද්ධ අධ්‍යයන) උපාධි පරීක්ෂණයේ අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා සකස් වූවකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ පාළි බෞද්ධ අධ්‍යයන අංශයේ ආචාර්ය නායිම්බල ධම්මදස්සී ස්වාමීන් වහන්සේගේ අධීක්ෂණය යටතේ සම්පාදනය කරන ලද අතර, මෙහි අන්තර්ගත සෑම දත්තයක් හා මූලාශ්‍රයක්ම ග්‍රන්ථ සඟරා පරිශීලනය කිරීමෙන් හා ක්ෂෙත්‍ර සමීක්ෂණ මඟින් ලබාගත් බවත්, මෙය මින් පෙර කිසිදු විශ්ව විද්‍යාලයක වෙනත් උපාධියක් සඳහා ඉදිරිපත් නොකරන ලද බවත්, මෙයින් ප්‍රකාශ කොට සිටිමි.

uljdesilva

යූ.එල්.ජයන්ති ද සිල්වා

උපදේශක වරයා / වරුන්ගේ සහතිකය

අපේක්ෂකයා විසින් ඉදිරිපත් කර ඇති

ප්‍රකාශය සත්‍ය බවත්, මෙම නිබන්ධය අගැයීම සඳහා විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු තත්වයක පවත්නා බවත් මම / අපි සහතික කොට සිටිමි / සිටිමු.

ආචාර්ය තායිම්බල ධම්මදස්සි හිමි

# පිදුම

ආදරය පිරි ශදින්
සෙනහසින් මා ඇඩි කොට
ලොවට බිහිකළ
සඳාදර මව්පියනි !

සිප් සතර ලබාදී
නිවැරදි මඟ දකින්නට
වරම් දුන්
ගුරුවරුනි !

සංසාරයේ පටන්
ජීවිතය මෙතෙක් දුර
මගේ දියුණුව පතා
අදත් මට දිරිය දෙන
සඳාදර හිමියනි !

ඔබට
උපහාර කොට
පුදන්නෙමි බැති බරින්

## උපකාරානුස්මෘති

මෙම ශාස්ත්‍රීය අධ්‍යයන කාර්යයේ දී මාගේ අභිවෘද්ධිය වෙනුවෙන් උපකාර කළ වෙහෙස මහන්සි වූ බොහෝ දෙනෙකි. ඔවුන් සියලු දෙනාටම මාගේ ගෞරවය හා ස්තූතිය හිමිවිය යුතුව ඇත.

මාගේ අභිවෘද්ධියම ප්‍රාර්ථනා කරන මා ගැන සතුටු වන මාගේ දයාබර මෑණියන් සහ මීට දසමසකට පෙර අපෙන් සමුගත් මගේ ආදරණීය පියාණන් සෙනගසින් යුතුව සිහිපත් කරමි.

සිප් සතර හැදෑරීමට නිතර මා ධෛර්යමත් කළ පොත පත සොයාදී මාගේ දියුණුවම අපේක්‍ෂා කළ මාගේ මාමා වූ වසරකට පෙර අපවත් වී වදාළ ශාස්ත්‍රපති පූජ්‍ය පිත්වත්තේ නන්දාරාම මහා නාහිමිපාණන් ද,

සිය මෑණියන් කෙරෙහි බැඳි සෙනෙහසින් මව් ගුණය සිහිපත් කොට "ශ්‍රී රාහුල මාතා අධි ශිෂ්‍යත්වය" මට ලබා දුන්, අපවත් වී වදාළ මහාචාර්ය වල්පොල ශ්‍රී රාහුල මහා නාහිමිපාණන් ද, ගෞරවයෙන් සිහිපත් කරමි.

අධ්‍යයනය ආරම්භයේ සිට අවසානය දක්වා ඉතාමත් කාර්ය බහුල තත්වයක් යටතේ වුවද සිය කාලය ශ්‍රමය කැප කරමින් අධ්‍යයනයේ නිමාවක් දැකීම සඳහා මග පෙන්වා දුන් මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර මහතා ද, මෙම අධ්‍යයන කාර්ය සඳහා අවශ්‍ය සියලු අවවාද අනුශාසනා හා උපදෙස් ලබාදුන් මාගේ

නිබන්ධන උපදේශක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය නායිම්බල ධම්මදස්සි හිමිපාණන්ද,

මේ අධ්‍යයන කාර්යයේදී බොහෝ උපදෙස් ලබාදුන් ආචාර්ය ආරියපාල පෙරේරා මහතා ද,

අධ්‍යයන කාර්යයේදී නොයෙක් උදව් උපකාර කළ අධ්‍යනාංශ ප්‍රධාන ආචාර්ය මීගොඩ පඤ්ඤාලෝක හිමිපාණන්ද, එච්. එම්. මොරටුවගම මහතා ඇතුළු බෞද්ධ අධ්‍යයන අංශයේ ආචාර්ය භවතුන් හා අතධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලු දෙනා ද,

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය සැකසීමට හා බොහෝ ගැටළු නිරාකරණය කර ගැනීමට උපදෙස් දෙමින් මා දිරිමත් කළ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ටෙනිසන් පෙරේරා මහතා ද,

මෙම අධ්‍යයනයේදී අවශ්‍ය උපදෙස් ලබාදී බොහෝ ව්‍යාකූලතාවයන් නිරවුල් කර දුන් කැළණිය විශ්ව විද්‍යාලීය පශ්චාත් බෞද්ධ අධ්‍යයන පීඨයේ මහාචාර්ය කපිල අභයවංශ මහතා ද,

විවිධ දුෂ්කරතා මධ්‍යයේ වුවද ක්ෂේත්‍ර සමීක්ෂණය මගින් අවශ්‍ය දත්ත රැස්කර ගැනීමට නොමඳ සහයක් දුන් මේජර් ජෙනරාල් ආනන්ද වීරසේකර මහතා ද,

පරිවර්තන කටයුතු සඳහා සිය කාලය මිඩංගු කරමින් මට සහය දුන් නිතිඥ පින්ප්‍රිය පේදුරුගේවා මහතා ද, මුස්ලිම් ආගම පිළිබඳව මා දැනුවත් කළ අයි. එල්. එම්. යෙහියා මහතා ද, යතුරු ලියනය සපයා දෙමින් මට උපකාර කළ නිතිඥ රෝහණ මතම්පේරි මහතාට ද, ඉතා කෙටි කලකින් යතුරු ලියනය කර දුන් වසන්ති මෙන්ඩිස් අබේපාල සොයුරියට ද, කරුණු රැස්කර ගැනීමේදී උපකාරි වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ රංජිත් සිල්වා ඇතුළු පුස්තකාලයේ සොයුරු සොයුරියන් ද, කළමනාකරණ හා වාණිජ්‍ය විද්‍යා පීඨයේ සියලුම කාර්ය මණ්ඩලයටද මගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

මෙම නිබන්ධය ආරම්භයේ සිට නිමාවක් දකින තුරු මා ධෛර්යමත් කරමින් හා සියලු අවශ්‍යතා සපුරා දෙමින් මූලිකව කටයුතු කළ මාගේ ආදරණීය ස්වාමි පුරුෂයා වන ජයරත්න සිල්වා ද විශේෂයෙන් සිහිපත් කරන්නේ හදපිරි සෙනහසිනි.

නිරතුරුවම මට උපකාර කරන මාගේ සහෝදර සහෝදරියන් හා හිත මිත්‍ර සියලු දෙනාට ද මාගේ කෘතඥතාවය පුදකරමි.

යූ. එල්. ජයන්ති ද සිල්වා
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
1998.09.30

පටුන


පිටු අංකය

I පිදුම

II උපකාරානුස්මෘති

III පටුන

IV හැඳින්වීම

මාතෘකාව හැඳින්වීම හා අධ්‍යයන ක්ෂේත්‍රය

පර්යේෂණ ක්‍රමවේදය

පළමු පරිච්ඡේදය

1. පුනරුත්ථාපන සංකල්පය

1.1 පුනරුත්ථාපනය යනු කුමක්ද 1

1.2 පුනරුත්ථාපනය පිළිබඳ විවිධ විග්‍රහයන් 1 - 4

1.2.1 පුනරුත්ථාපනය පිළිබඳ විවිධ ආගමික සංකල්ප 4 - 6

1.2.2 වෛද්‍ය විද්‍යාවට අනුව පුනරුත්ථාපන සංකල්පය 6

1.2.3 පුනරුත්ථාපනය පිළිබඳ මනෝ විද්‍යාත්මක මත 7

1.2.4 පුනරුත්ථාපනය පිළිබඳ දණ්ඩනවේදී මත 8 - 9

2. පුරාණ සිංහල අඩුවම් ක්‍රම හා පුනරුත්ථාපනය 9 - 11

3. පුනරුත්ථාපනය සම්බන්ධ අධිකරණමය ක්‍රියාදාමය හා අණපනත් 11

3.1 අධිකරණය යනු 11 - 13

3.2 අධිකරණ ව්‍යුහය 13 - 16

3.3 පුනරුත්ථාපනයට සම්බන්ධ අණපනත් 16

| | | |
|---|---|---|
| 3.3.1 | 1996 අංක 29 දරණ රාජ්‍ය ව්‍යවසාය පුනරුත්ථාපනය කිරීමේ පනත | 16 - 17 |
| 3.3.2 | 1944 අංක 42 දරණ වරදකරුවන් පරිවාසය පිට තැබීමේ පනත | 17 |
| 3.3.3 | 1939 අංක 38 දරණ ළමා හා තරුණ වරදකරුවන් පිළිබඳ පනත | 18 - 19 |
| 3.3.4 | ගණිකා මඩම් පිළිබඳ පනත | 19 - 24 |


දෙවන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 2 | පුනරුත්ථාපන ගැටළුව හා එයට අදාළ බෞද්ධ ඉගැන්වීම් | 25 |
| 2.1 | ඓතිහාසික පසුබිම | 25 - 30 |
| 2.2 | ශික්ෂා පද පැනවීම | 30 - 32 |
| 2.2.3 | පාරාජිකා ( අප්‍රති කම් ආපත්ති ) | 33 - 35 |
| 2.4 | සුළු අපරාධ හා ඒවායේ ප්‍රභේද | 35 - 60 |
| 3. | භික්ෂුණී ආචාර ධර්ම | 61 - 68 |
| 4. | බෞද්ධ පුනරුත්ථාපන කාර්යය | 68 |
| 4.1 | ආපත්ති ආරෝචනය | 68 |
| 4.2 | ආපත්ති පටිච්ඡාදනය | 69 |
| 4.3 | පරිවාස | 70 |
| 4.3.1 | අග්ඝසමෝධාන පරිවාසය | 70 |
| 4.3.2 | සුද්ධන්ත පරිවාසය | 71 |
| 4.3.3 | මානත්ත සමාදානය | 72 - 74 |
| 4.3.4 | අබ්භාන විනය කර්මය | 75 - 76 |

තෙවන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 3. | බුදු සමයේ චරිත විශෝධන නමයතා | 77 |
| 3.1 | බෞද්ධ ආචාර ධර්ම | 77 - 102 |
| 3.2 | බුදු දහමෙහි දැක්වෙන පුද්ගල වර්ගීකරණය | 103 - 106 |
| 3.3 | බුදු සමයෙහි චරිත විශෝධනයට ලක්වූවෝ | 106 |
| 3.3.1 | පුද්ගල දමන | 107 - 119 |
| 3.3.2 | භික්ෂු දමනය | 117 - 120 |


සිව්වන පරිච්ඡේදය


| | | |
|---|---|---|
| 4. | නූතන ශ්‍රී ලංකා පුනරුත්ථාපන ක්‍රියා මාර්ග විෂයෙහි බෞද්ධ ඉගැන්වීම්වල අදාලත්වය | 121 |
| 4.1 | බාලාපරාධකරුවන් පුනරුත්ථාපනය | 121 - 130 |
| 4.2 | සිරකරුවන් පුනරුත්ථාපනය | 130 - 134 |
| 4.3 | නොමඟට ගිය කාන්තාවන් පුනරුත්ථාපනය | 134 - 136 |
| 4.4 | රාජ්‍ය විරෝධී ත්‍රස්තවාදීන් පුනරුත්ථාපනය | 136 |
| 4.4.1 | රාජ්‍ය විරෝධීන් ත්‍රස්තවාදයට පෙළඹීමට හේතු | 137 - 141 |
| 4.4.2 | පුනරුත්ථාපනයේදී සැලකිය යුතු කරුණු | 142 - 144 |
| 4.4.3 | පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල්වරයා සහ කාර්යාංශයේ කටයුතු | 145 |
| 4.4,4 | ආගමික හා සංස්කෘතික අංශය | 146 |
| 4.4.5 | තරුණ ප්‍රතිසංවර්ධන මධ්‍යස්ථාන හා විහාරස්ථාන ආශ්‍රිත මධ්‍යස්ථානවල පොදු ආගමික හා සංස්කෘතික කටයුතු | 147 |

4.4.6 මධ්‍යස්ථාන හා විහාරස්ථාන ආශ්‍රිත මධ්‍යස්ථානවල සිදු කෙරෙන විශේෂ කාර්ය 148 – 149

4.4.7 පුහුණු කටයුතු 153

4.4.8 ආරක්ෂක සංවිධාන 162 – 167

පස්වන පරිච්ඡේදය

නූතන පුනරුත්ථාපන සංකල්පය හා බෞද්ධ සංකල්ප තුලනය 168 – 177

ආශ්‍රිත ග්‍රන්ථ 178 – 183

ඇමුණුම් I – vIII

ප්‍රශ්නාවලිය (අභ්‍යාසලාභීන් සඳහා)

ප්‍රශ්නාවලිය ( නිලධාරීන් සඳහා )

## හැකුළුම්

| | | |
|---|---|---|
| අං නි. | – | අංගුත්තර නිකාය |
| ඛු නි. | – | ඛුද්දක නිකාය |
| දී නි. | – | දීඝනිකාය |
| ධ ප ක. | – | ධම්මපදට්ඨකථා |
| ධ ප. | – | ධම්මපදය |
| ප ප ජා. | – | පන්සිය පනස් ජාතකය |
| පා පා. | – | පාචිත්තියපාළි |
| පාරා. | – | පාරාජිකාපාළි |
| ම නි. | – | මජ්ඣිම නිකාය |
| ම ව පා. | – | මහාවග්ග පාළි |
| ම ව. | – | මහාවංශය |
| ස පා. | – | සමන්තපාසාදිකා |
| සං නි. | – | සංයුක්ත නිකාය |
| සං . | – | සංස්කරණය |
| බු ජ ත්‍රි ග්‍ර. | – | බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා |

| | | |
|---|---|---|
| E A. | - | Encyclopedia of Americana |
| O E D. | - | The Oxford Englisg Dictionary |
| D P P. | - | Dictionary of Pali Propernames |
| N E B. | - | The New Encyclopedia of Britanica |
| P E D. | - | Pali English Dictionary |
| P T S. | - | Pali Text Society |
| P S S L. | - | Prisons Statistics of Sri Lanka |
| B M D. | - | The Bantam Medicle Dictionary |
| V R E. | - | Vocational Rehabilitation in Employment of Disable a Glossary |

155038

# හැඳින්වීම

පුනරුත්ථාපනය යන්න ලංකාවේ පමණක් නොව අද ලෝකයේ සියලු දෙනාගේ ම අවධානයට ලක්වූ වචනයකි. ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසයේ ඇති වූ ත්‍රස්තවාදී ක්‍රියා සම්බන්ධයෙන් මෙම වචනයට විශේෂ ස්ථානයක් හිමි වූ අතර, එය එක් විෂයකට සීමා වූ වචනයක් ද නොවේ. බටහිර සමාජයෙන් ඇරඹී ලොව පුරා ව්‍යාප්ත වූ මෙම සංකල්පය ශ්‍රී ලංකා සමාජයේ ද පවතින්නා වූ තරුණ අසහනය හමුවේ වැදගත් සංකල්පයක් බවට පත්ව ඇත.

බන්ධනාගාර දෙපාර්තමේන්තුව, සමාජ සේවා දෙපාර්තමේන්තුව, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වැනි රජයේ ආයතන මෙම සංකල්පය සිය රාජකාරි ක්ෂේත්‍රය තුළ යොදවා ඇති ආකාරයෙන් එහි අවශ්‍යතාව කොතරම් ද යන්න වැටහේ.

අද ලෝකයේ පුනරුත්ථාපනය යන්න අපරාධකරුවන්, බාලාපරාධකරුවන්, ත්‍රස්තවාදීන් හට පමණක් නොව අනෙකුත් පුද්ගල කොටස්වලට ද වැදගත් වී ඇත. එමෙන් ම සමාජ විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, මනෝ විද්‍යාව, ජීව විද්‍යාව වැනි විවිධ විෂයයන්හි ද පුනරුත්ථාපනය ප්‍රධාන සංකල්පය බවට පත්වී තිබේ. බාලාපරාධකරුවන් සම්බන්ධව ද පුනරුත්ථාපනය ඉතා ප්‍රයෝජනවත් මෙහෙයකට දායක වේ. අපරාධ වනාහී මිනිසා විසින් තම පෞරුෂය තුළ සදාකාලිකව අන්තර්ගත කරගන්නා වූ තත්වයක් නොවේ. කිසියම් හේතු ප්‍රත්‍ය සාමාග්‍රියක් නිසා උද්ගත වන මෙම තත්වය නිරාකරණය කර ගත හැකි බව බුදු දහම උගන්වයි.

බුදු සමය තුළ දී මෙම නිරාකරණය පුනරුත්ථාපනය ලෙස හැඳින්වෙයි. එම සමාජගත අපරාධ නිරාකරණය පිළිබඳව සූත්‍රානුසාරයෙන් මෙන්ම විනය පිටකය තුළින් ද පැහැදිලි වේ. විනය පිටකය තුළ දී සංඝාදිසේස ඇවැත්වලට වැටුණු භික්ෂුවක් ඉන් ඉවත් කර ගන්නා ආකාරය පෙන්වා දෙයි. පුනරුත්ථාපන ඉතිහාසය බෞද්ධ භික්ෂූන් පුනරුත්ථාපනය තුළින් ඇරඹේ.

නීති විරෝධී හැසිරීම් හේතු කොට ගෙන බෞද්ධ සමාජයට අනුරූප නොවන ආකාරයෙන් හැසිරෙන විට ඔවුන් නගා සිටුවීම සඳහා කටයුතු කිරීම පුනරුත්ථාපනය නමින් හැඳින්වේ. ගිහි සමාජයට වඩා බෞද්ධ භික්ෂු භික්ෂුණී සමාජ තුළ වඩාත් බහුල ලෙස පුනරුත්ථාපන කටයුතු සිදු වූ බව පෙනේ.

මානව සමාජය නවීකරණය වීමත් සමඟ අපරාධ චර්යාවන් හි ද වෙනස් මුහුණුවරක් ගෙන ඇති බව පෙනේ. අපරාධකාරී චර්යා වැළැක්වීම සඳහා අධිකරණය මඟින් නීතිමය ප්‍රතිපාදන සලසා තිබුණ ද , එය බොහෝ දුරට අඩුවමට බර වූවකි. අපරාධකාරී චර්යා වැළැක්වීමට හා පාලනයට ආයතන ගණනාවක් තිබුණද ඒවා සහ අධිකරණය සහජීවනයෙන් කටුයතු කිරීමක් සිදු නොවන බැවින් අධිකරණය තවමත් අඩුවමට ප්‍රමුඛතාවයක් ලබාදෙයි. එමෙන්ම පොලීසිය , බන්ධනාගාරය පරිවාසය වැනි ආයතනය අධිකරණය හමුවේ අසරණ වේ. එබැවින් නූතන පුනරුත්ථාපනය සංකල්පයට අදාලව අධිකරණය මඟින් අඩුවම් ලිහිල් කොට විශේෂයෙන් තරුණ කොටස් සම්බන්ධයෙන් ගත් දැඩි පියවර ලිහිල් වූ ආකාරයක් නොපෙනේ. එහෙත් බාලාපරාධ කරුවන් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් උසාවිය , පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සහතික කළ පාසැල්වලට යැවීමට කටුයුතු කිරීම පුනරුත්ථාපනය යොදාගත් අවස්ථාවක් ලෙස පෙනේ. නූතන අපරාධ සම්බන්ධයෙන් ද අඩු පිරිවැයක් උපයෝගි කර ගනිමින් යොදාගත නොහැකි සමාජමය ක්‍රියාමාර්ග සොයා බලා ඒ අනුව අඩුවම්වල වෙනසක් ඇති කිරීම කාලෝචිත බව පෙනේ.